# ACCOUNTING FOR PARTNERSHIP (Part-III)


***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම

හවුල් ව්‍යාපාරවල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හිමිකම ගණනය කිරීම සඳහා ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම පිළියෙල කිරීම අවශ්‍ය වේ.

ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම වෙන් වෙන් ව තිබිය යුතු අතර ඒවා අනු තීරු ක්‍රමයට තබාගත යුතු ය.

ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් හා ජංගම ගිණුම් ශේෂයන්ගේ එකතුව හවුල් ව්‍යාපාරයේ මුළු හිමිකම නියෝජනය වේ.

බාහිර පාර්ශ්ව විසින් සපයා ඇති ණය, හිමිකමක් නොව වගකීමක් ලෙස හඳුනා ගත යුතුය.

ClassWork.LK

# ප්‍රාග්ධන ගිණුම

ස්ථාවර හිමිකම් වාර්තාකරණ ගිණුම ප්‍රාග්ධන ගිණුමයි. එහි පහත අයිතම ඇතුළත් කරයි.

- ප්‍රාග්ධන ගිණුමේ ආරම්භක ශේෂය
- අතිරේක ප්‍රාග්ධනය
- ඒකාග්‍රතාව මත ප්‍රාග්ධන ආපසු ගැනීම්

# ජංගම ගිණුම

විචල්‍ය හිමිකම වාර්තාකරණ ගිණුම ජංගම ගිණුමයි. එහි පහත අයිතම ඇතුළත් කරයි.

- ප්‍රාග්ධන පොළී
- හවුල් වේතන
- ගැනිලි
- ලාභ කොටස් / අලාභ කොටස්
- හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා පොළිය
- හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් දරා ඇති ව්‍යාපාර වියදම්

ClassWork.LK

# නිදසුන්

(01) රවී, මනී සහ සනී ගෙන යන හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ ඇතුළත් ප්‍රතිපාදන පහත දැක්වේ.

- ගිණුම් කාලච්ඡේදයේ ආරම්භයේ ඇති ප්‍රාග්ධන ගිණුම් ශේෂයන් සඳහා වර්ෂයකට 10% ක පොළී ගෙවනු ඇත.
- සෑම හවුල්කරුවෙක් ම මසකට රු. 30 000/- බැගින් හවුල් වේතන හිමිකම් ලබයි.
- ප්‍රාග්ධනයට අතිරේක ව හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා 10% ක පොළී ගෙවන අතර ලාභාලාභ සමාන ව බෙදා ගනී.

2016/04/01 දිනට හවුල්කරුවන්ගේ පෞද්ගලික ගිණුම් ශේෂයන් මෙසේය.

| | රවී | මනී | සනී |
|---|---|---|---|
| ප්‍රාග්ධනය (රු.'000) | 5 000 | 4 000 | 4 000 |
| මුළු හිමිකම (රු.'000) | 5 400 | 4 200 | 3 700 |

ClassWork.LK

2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ එක් එක් හවුල්කරු පහත ගැනිලි සිදු කර ඇත.

| | |
|---|---|
| රවී | රු. 480 000 |
| මනී | රු. 500 000 |
| සනී | රු. 320 000 |

2016/04/01 දින මනී සපයා ඇති ණය ගිණුමේ ශේෂය රු. 200 000 කි.

ණය පොළී අඩු කිරීමට පෙර රු. 2 580 000 ක ශුද්ධ ලාභයක් 2017/03/31 දිනෙන් අවසන් වර්ෂයේ දී හවුල් ව්‍යාපාරය උපයා ඇත.

2017/03/30 දින එක් එක් හවුල්කරුවන් රු. 1 000 000 බැගින් ආයෝජනය කර ඒ මුදලින් එදින ම යන්ත්‍රයක් ලබා ගෙන ඇත.

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හා ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කරන්න.

ClassWork.LK

# පිළිතුරු

## හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම

(රු.000)

| | රවී | මනී | සනී | | රවී | මනී | සනී |
|---|---|---|---|---|---|---|---|
| ප/ගෙ/ශේ | 6 000 | 5 000 | 5 000 | ඉ/ගෙ/ශෙ | 5 000 | 4 000 | 4 000 |
| | | | | යන්ත්‍ර ගිණුම | 1 000 | 1 000 | 1 000 |
| | 6 000 | 5 000 | 5 000 | | 6 000 | 5 000 | 5 000 |
| | | | | ඉ/ගෙ/ශේ | 6 000 | 5 000 | 5 000 |

## හවුල්කරුවන්ගේ ජංගම ගිණුම

(රු.000)

| | රවී | මනී | සනී | | රවී | මනී | සනී |
|---|---|---|---|---|---|---|---|
| ඉ/ගෙ/ශේ | - | - | 300 | ඉ/ගෙ/ශේ | 400 | 200 | - |
| ගැනිලි | 480 | 500 | 320 | හවුල් වේතන | 360 | 360 | 360 |
| ප/ගෙ/ශේ | 840 | 540 | 200 | ප්‍රාග්ධන පොළී | 500 | 400 | 400 |
| | | | | ණය පොළී | - | 20 | - |
| | | | | ලාභ කොටස් | 60 | 60 | 60 |
| | 1 320 | 1 040 | 820 | | 1 320 | 1 040 | 820 |
| | | | | ඉ/ගෙ/ශේ | 840 | 540 | 200 |

Class Work LK

# පෙර වැඩ

| | | |
|---|---|---|
| | | රු. |
| ශුද්ධ ලාභය | | 2 580 000 |
| අඩු : ණය පොළී | 20 000 | |
| ප්‍රාග්ධන පොළී | 1300 000 | |
| හවුල් වේතන | 1 080 000 | (2400 000) |
| බෙදිය යුතු ලාභය | | 180 000 |
| ලාභ කොටස් - රවී | 60 000 | |
| - මනී | 60 000 | |
| - සනී | 60000 | (180000) |
| - | | 0 |

ClassWork.LK

# අභ්‍යාස

(01) හවුල්කරුවන් ව්‍යාපාරයක ජංගම ගිණුමේ වාර්තාකරන ගනුදෙනු 4ක් සඳහන් කරන්න.

(02) ප්‍රාග්ධන ගිණුම ස්ථාවර ව පවත්වා ගෙන යාමෙන් අපේක්ෂිත අරමුණ සඳහන් කරන්න.

(03) හවුල් ව්‍යාපාරයෙන් හවුල්කරුවෙකු ණයක් ගෙන ඇත්නම්, එයට අදාළ පොළිය ව්‍යාපාරයේ ලාභයට එකතු කිරීම පිළිබඳ ව ඔබේ අදහස ඉදිරිපත් කරන්න.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura